**නානාට්ටාන් ප්‍රාදේශීය සභාව**

**මන්නාරම දිස්ත්‍රික්කය**

**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**----------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 වන දිනද විගණනයට ඉදිරිපත්කර තිබුණි. වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුලි 18 දින සභාවේ ලේකම්ට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නානාට්ටාන් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**----------------------**

(අ) 2015 වර්ෂයට අදාල වියදම් විෂයයන් 11 ක වටිනාකම්වූ රු. 138,451 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2017 වර්ෂයට අදාල වියදම් විෂයයන් 02 ක වටිනාකමවූ රු. 77,783 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) හඳුනා නොගත් ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ශේෂපත්‍රයේ ජංගම වගකීම් වශයෙන් දක්වා තිබීමෙන්, සමුච්චිත අරමුදල රු. 154,146 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ ආදායම් වැඩසටහටනෙහි සේවා ගාස්තු වල රු. 2,077,840 ක්වූ උසාවි දඩ මුදල්ද ඇතුලත් වි තිබීමෙන් සේවාවන්වලින් ආදායම් රු. 2,077,840 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මෝටර් වාහන 13 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණද, ඉන් වාහන 05 ක් සඳහා ඉකුත් වර්ෂයට අදාල ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබීමෙන් දඩ මුදල් වශයෙන් රු. 7,150 ක් ගෙවා තිබුණි.

## 1.3.2 නීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) | |
| (i) රීති අංක 5(xii) | මුදල් ගබඩා භාණ්ඩ භාරව ක්‍රියාකරන නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ii) රීති අංක 59 | එක් එක් වර්ෂ ආරම්භයේදී ආදායම් පරීක්ෂක, ආදායම් අධීක්ෂක හෝ සභාපතිවරයාගෙන් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු සභා බලප්‍රදේශයේ සමීක්ෂණයක් පවත්වා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වන වගන්තිය අනුව ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙලකර නොතිබීමෙන් ව්‍යාපාර බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) රීති අංක 178(3) | භාණ්ඩ සැපයිම සඳහාවූ ආයතනවල ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| (iv) රීති අංක 218 | සියළුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයේදීම එක් වතාවක් හෝ සභාපති විසින් අධීක්ෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 371 | 2001 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදය තුල විවිධ ක්‍රියාකාරකම් සඳහා ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ට සහ වෙනත් |

| | | |
|---|---|---|
| | | පාර්ශවයන්ට ගෙවන ලද රු. 1,822,105 ක අත්තිකාරම් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත්වූ රු. 647,033 ක් වටිනා තැන්පත් ශේෂ 33 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.<br>- සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුලට ගෙවියයුතු 2011 වර්ෂය සිට 2012 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අදාල ගෙවීම් 12 ක එකතුව රු. 123,385 ක් විගණන දිනය වන 2016 මැයි 23 වන දින දක්වා ආපසු නොගෙවා ප්‍රාදේශීය සභාවේ තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.<br>- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ගෙවීම් 2 කට අදාල එකතුව රු. 50,358 ක් 2016 මැයි 23 විගණන දිනය දක්වා ගෙවීම් නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 8,119,549 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 7,335,045 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව පහත සඳහන් ආදායම් විෂයයන්ගේ සමාලෝචිත වර්ෂය සඳහාවූ ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණවිය.

| ආදායම් ප්‍රභවය | අයවැය ගත (රු.) | තත්‍ය (රු.) | හිඟ (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් හා බදු | 460,000 | 366,462 | 93,538 | 20 |
| කුලී | 6,095,995 | 7,833,168 | (1,737,173) | (28) |
| බලපත්‍ර ගාස්තු | 620,000 | 724,964 | (104,964) | (17) |
| සේවා සඳහා ගාස්තු | 2,919,000 | 4,739,921 | (1,820,921) | (62) |
| වරෙන්තු ගාස්තු | 132,000 | 60,482 | 71,518 | 54 |
| | 10,226,995 | 13,724,997 | (3.498,002) | |

**2.2.2 කුලී**

(අ) සභා බලප්‍රදේශයේ තිබෙන උපකාර්යාලය 03 ක ආදායම් අයිතම් 04 ක හිඟ මුදල් රු. 787,100 ක් අයකර ගැනීම සඳහා සභාව පියවර ගෙන නොතිබුණි.

(ආ) සභා බලප්‍රදේශයේ සන්නිවේදන කුළුණු 06 ක් ස්ථාපනය කර තිබුණද, ඉන් සන්නිවේදන ආයතන 02 කින් අයවියයුතු ගාස්තු රු. 50,000 ක් මෙතෙක් සභාව විසින් අයකර ගෙන නොතිබුණි.

(ඇ) සභා බලප්‍රදේශයේ තිබෙන සන්නිවේදන කුළුණු වලින් සමාලෝචිත වර්ෂයට අදාල බදු අයකර ගෙන තිබුණද, කුළුණු ආරම්භ කළ දිනය සිට 2015 වර්ෂය දක්වා වූ හිඟ බදු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**2.2.3 මුද්දර ගාස්තු**

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අදාලව පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබියයුතු හිඟ මුද්දර ගාස්තු රු. 8,460,871 ක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල ලැබියයුතු මුදලක් ලෙස දක්වා නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචිතය

---------------------------

## 3.1 කළමනාකරණ දුර්වලතා

---------------------------

(අ) ප්‍රාදේශීය සභා යටතේ වූ මුරුංගන් වෙළඳ සංකීර්ණයේ අංක 12 දරන කඩ කාමරයේ බදුකරු විසින් බදු ගිවිසුමට පටහැනිව වායු සමීකරනයක් සවිකර තිබුණද විගණන දිනය දක්වා ආදායම් පරික්ෂක විසින් ඒ සම්බන්ධව පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව යටතේවූ මුරුංගන් වෙළඳ සංකීර්ණයේ තිබෙන කඩ කාමර 32 කින් කඩ කාමර 20 ක් බදු කරුවන් බදු ගිවිසුම්වලට පටහැනිව විදුලිබිල ගෙවීම පැහැර හැර ඇති බැවින් කඩ කාමර 12 ක ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලි මනු ගලවා ගෙන ඇති අතර කඩ කාමර 8 ක විදුලිය විසන්ධි කර තිබුණද ආදායම් පරීක්ෂක, මුරුංගන් උප කාර්යාලයේ කාර්යභාර නිලධාරි සහ නානාට්ටාන් ප්‍රාදේශීය සභාවේ ලේකම්විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවේ පාලනය යටතේ ලැයිස්තුගත නිලධාරීන් 34 දෙනාගෙන් නිලධාරින් 5 දෙනෙකු වසර 12 – 22 ක් අඛණ්ඩව සේවය කරන බව නිරීක්ෂණය විය.

## 3.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභා බලප්‍රදේශයේ බැහැර කරන කසල ගිනි තැබීම, පිළිස්සීම සභාව විසින් කරන අතර, කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරනය යන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------.

## 4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ වරෙන්තු ගාස්තු ආදායම් රු. 132,000 ක් ඇස්තමේන්තු කර තිබුණද සියයට 46 ක ආදායම් රැස්කර නොතිබුණි.

## 4.2 අකාර්යක්ෂමතාවය

---------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුවේ වියදම් 3 ක් සඳහා රු. 1,213,805 ක් ඇස්තමේන්තු කර තිබුණද, රු. 665,897 ක් පමණක් වැයකර තිබීමෙන් ඇස්තමේන්තුගත ඉලක්කය ලබා ගැනීමට සභාවට නොහැකිවී ඇත.

**4.3 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ධාවන තත්වයේ තිබෙන වාහන සඳහා නියමිත කාලවල ආදායම් බලපත්‍ර ලබා ගැනීමට වාහන භාර නිලධාරි සහ රියදුරු ක්‍රියා නොකිරීමෙන් 2016 වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී රු. 6,305 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

(ආ) වාහන ධාවන සටහන් සහ ගබඩා ලේඛන පරීක්ෂා කිරීමේද වාහන 04 කට අදාලව රු. 34,200 ක් වටිනා ඩීසල් ලීටර් 360 පාරිභෝජන ගබඩා ලේඛනයේ සටහන් කර තිබුණද, ධාවන සටහන් වල සටහන් කර නොතිබූබව විගණනයේදී නිරීක්ෂණය විය.

**5 පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ආදායම් රැස්කිරීම

(ආ) අයවැය පාලනය

(ඇ) ලැබියයුතු ගිණුම්

(ඈ) අත්තිකාරම් ගිණුම්

(ඉ) ගිණුම්කරණය